සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | පුරවැසි අධ්‍යාපනය | 2 | 4. පළාත් පාලන ආයතන |

1


සැකසුම:

සුනේත්‍රා විතානගේ

බප/හො/සිරිමෙවන් මහා විද්‍යාලය

පොකුණුවිට

# 04 පළාත් පාලන ආයතන

ප්‍රජා සේවා පහසුවෙන් හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ආයතන විශේෂය, පළාත් පාලන ආයතන ලෙස හැඳින්වේ



# පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව

**පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව**

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රාදේශීය මට්ටම දක්වා පුළුල් කිරීම
- ප්‍රාදේශීය අවශ්‍යතාවලට ගැළපෙන පරිදි කටයුතු කිරීම
- ප්‍රජා සේවා විධිමත්ව පවත්වාගෙන යාමට පහසු වීම
- ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය වේගවත් කිරීම
- ප්‍රාදේශීය ප්‍රතිපත්ති පදනම් කරගෙන ජාතික ප්‍රතිපත්ති සකස් කර ගැනීමට පහසු වීම
- මධ්‍යම ආණ්ඩුවේ කටයුතු විමධ්‍යගත කිරීම මගින් ප්‍රාදේශීය පාලන කටයුතු පහසු කර ගැනීම
- දේශපාලන නායකත්වය සඳහා තරුණ සහභාගිත්වය පුළුල් කිරීම
- අනාගත දේශපාලන නායකයන් ප්‍රාදේශීය මට්ටමින් බිහි කර ගත හැකිවීම
- හදිසි අවස්ථාවල දී ක්ෂණිකව ක්‍රියාත්මක වීම පහසු වීම

# පළාත් පාලන ආයතනවල ආරම්භය

- ක්‍රි. ව. 1865 දී අංක 17 දරන මහනගර සභා ආඥාපනත මගින් කොළඹ, මහනුවර, ගාල්ල යන මහනගර සභා පිහිටුවීම
- ක්‍රි. ව. 1871 අංක 26 දරන ගම්කාර්ය සභා ආඥා පනත මගින් 1871 ගම්කාර්ය සභා පිහිටුවීම
- ක්‍රි. ව. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත මගින් 1940 දී නගර සභා පිහිටුවීම
- 1946 අංක 03 දරන සුළු නගර සභා පනත මගින් 1946 දී සුළු නගර සභා පිහිටු වීම



# ශ්‍රී ලංකාවේ මුලින්ම ආරම්භ කළ මහනගර සභා



කොළඹ මහනගර සභාව



මහනුවර මහනගර සභාව



ගාල්ල මහනගර සභාව

## නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන

ගම්සභා

සුළුනගර සභා

නගර සභා

මහනගර සභා

## 1987 න් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන

**ප්‍රාදේශීය සභා**

**නගර සභා**

**මහ නගර සභා**

# ප්‍රාදේශීය සභාවක ව්‍යුහය

සභාපති

↓

උපසභාපති

↓

- ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්
- රාජ්‍ය නිලධාරීන්
  - ↓ ලේකම්
  - ↓ අනෙකුත් නිලධාරීන්




උදා:- කාර්මික නිලධාරීන්, කළමනාකරණ සහකාර, රියදුරු, සුළු සේවක, කම්කරු

# නගර සභාවක ව්‍යුහය

- සභාපති
  - උපසභාපති
    - නාගරික සභා මන්ත්‍රීවරුන්
    - රාජ්‍ය නිලධාරීන්
      - ලේකම්
        - අනෙකුත් නිලධාරීන්




උදා:- කාර්මික නිලධාරීන්, කළමනාකරණ සහකාර, රියදුරු, සුළු සේවක, කම්කරු

# මහනගර සභාවක ව්‍යුහය

නගරාධිපති / පුරපති

↓

නියෝජ්‍ය නගරාධිපති

↓

- නාගරික සභා මන්ත්‍රීවරුන්
- රාජ්‍ය නිලධාරීන්
  - ↓ ලේකම්
  - ↓ අනෙකුත් නිලධාරීන්




උදා:- කාර්මික නිලධාරීන්, කළමනාකරණ සහකාර, රියදුරු, සුළු සේවක, කම්කරු

# පළාත් පාලන ආයතන සතු බලතල

- වරිපනම් බදු ඇතුළු අනෙකුත් බදු පැනවීමට
- වීථි රේඛා සහතික නිකුත් කිරීමට
- නිවාස සැලසුම් අනුමත කිරිමට
- ස්ථිර ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සදහා අවසර දීමට
- අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට
- පරිසර සංරක්ෂණයට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීමට
- ප්‍රසිද්ධ මාර්ග, වීථි ඇළ මාර්ග, පාලම්, පොදු වෙළෙඳ පොළ, බෙහෙත් ශාලා, පුස්තකාල, උද්‍යාන ආදිය ඉදිකිරීමට හා නඩත්තු කිරීමට
- බෝවන රෝග වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට
- අනවසර මුඩුක්කු, පැල්පත් හා සෞඛ්‍යයට හානි කරන ස්ථාන ඉවත් කිරීමට
- ස්වාභාවික ජල උල්පත් හා ජලාශ පිළිබඳ අයිතිය පවත්වා ගැනීමට

# පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාරය

- වරිපනම්/ බදු මුදල්
- පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතනවලට වෙන් කරනු ලබන ප්‍රදාන
- පළාත් පාලන ආයතනය සතු දේපළ බදු දීම්වලින්/ කුලියට දීමෙන් ලැබෙන මුදල් (උදා : නගර ශාලා, කඩ, සාප්පු ආදිය)
- පොදු සේවා සැපයීමෙන් ලැබෙන ආදායම්
- නීති කඩකිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණය මගින් අය කරන දඩ මුදල්වලින් ලැබෙන ප්‍රතිපාදන
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හා අදාළ සභාවේ අනුමැතිය ඇතිව විදේශ රාජ්‍යවලින් ආධාරමය වශයෙන් ලැබෙන පරිත්‍යාග හා රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබෙන පරිත්‍යාග



# පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කිරීම

- නිර්ණායක

  - ජන වාර්ගික ජනගහන අනුපාතය
  - භූගෝලීය ප්‍රදේශය හා එහි භෞතික ලක්ෂණ
  - ජනගහනය හා ජන ඝනත්වය
  - ආර්ථික සංවර්ධන මට්ටම

# පළාත් පාලන ආයතන වලින් ඉටු කෙරෙන සේවා



පුස්තකාල සේවය



පෙර පාසලක්



ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු



ළමා උද්‍යානයක්



ගිනි නිවීමේ සේවය



ප්‍රාදේශීය මාර්ග නඩත්තු කටයුතු



පොදු ළිඳ



මළාපවාහන ගලි සේවය



ඩෙංගු පාලන වැඩසටහනක්



ප්‍රතිචක්‍රීකරණය සඳහා කසළ එක්රැස් කිරීම



මාතෘ සායන



ග්‍රාමීය වෛද්‍ය සායනයක්

# පළාත් පාලන ආයතන වල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටු කළ යුතු යුතුකම්

- කලට වේලාවට නියමිත බදු ගෙවීම
- සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම
- කසළ හා අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම හා කසළ කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතනවලින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරිම
- පරිසරය පිරිසිදුව තබා ගැනීම හා පරිසර සංරක්ෂණ කටයුතු සඳහා දායක වීම
- පොදු දේපළ ආරක්ෂා කිරීම හා අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීම
- ඉදිකිරීම් වැනි කටයුතුවල දී නීත්‍යනුකූල අනුමැතිය ලබා ගැනීම
- පළාත් පාලන ආයතනයට සම්බන්ධ මහජන නියෝජිතයන් හා නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම
- ප්‍රාදේශීය අවශ්‍යතා පිළිබඳව මහජන නියෝජිතයන් සහ නිලධාරීන් දැනුම්වත් කිරිම
- සේවා බිඳවැටීම්වල දී හෝ හදිසි අවස්ථාවල දී නඩත්තු කටයුතු පිළිබඳව දැනුම්වත් කිරීම

## ජාතික සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතන වල දායකත්වය

- ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනා ගැනීම
- ප්‍රාදේශීය අවශ්‍යතා ඉටු කිරීම සඳහා සම්පත් හඳුනාගෙන ඊට ගැළපෙන ලෙස සැලසුම් සකස් කිරීම
- සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය නායකයන් බිහි කිරීම

## ප්‍රාදේශීය අවශ්‍යතා විවිධත්වයට බලපාන සාධක

සම්පත් වල ව්‍යාප්තිය
සංස්කෘතික විවිධත්වය
භූගෝලීය පසුබිම

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | පුරවැසි අධ්‍යාපනය | 2 | 4. පළාත් පාලන ආයතන - ඇගයීම |

**සැකසුම: සුනේත්‍රා විතානගේ**

**බප/හො/සිරිමෙවන් ම.වි, පොකුණුවිට**

1. පළාත් පාලන ආයතන යනු කුමක්ද?
2. අප රට තුළ පළාත් පාලන ආයතන අවශ්‍ය වීමට බලපාන හේතු දෙකක් ලියන්න
3. ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලන ආයතන වල ආරම්භය සිදු වූයේ කුමන කාලයේද?
4. ශ්‍රී ලංකාවේ මුලින්ම ආරම්භ කළ මහ නගර සභා තුන නම් කරන්න
5. නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන මොනවාද?
6. වර්තමානයේ අප රටේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග තුන මොනවාද?
7. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා පිහිටුවන ලද්දේ කුමන පනතින්ද?
8. වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහ නගර සභා සංඛ්‍යාව කීයද?
9. මහ නගර සභාවක ප්‍රධානියා කවුද?
10. නගර සභාවක/ ප්‍රාදේශීය සභාවක ප්‍රධානියා කවුද?
11. මහ නගර සභාවක ප්‍රධාන රාජ්‍ය නිලධාරියා හැඳින්වෙන්නෙ කෙසේද?
12. පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල දෙකක් ලියන්න
13. පළාත් පාලන ආයතන සතු බලතල දෙකක් ලියන්න
14. පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාර දෙකක් ලියන්න
15. පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේදී සැළකිල්ලට ගනු ලබන නිර්ණායක දෙකක් ලියන්න
16. පළාත් පාලන ආයතන වලින් ඉටු කෙරෙන සේවා තුනක් ලියන්න
17. පළාත් පාලන ආයතන වලින් සැපයෙන සේවා සඳහා මහජනතාව විසින් ඉටු කළ යුතු යුතුකම් දෙකක් ලියන්න
18. පළාත් පාලන ආයතන වල මහජන නියොජිතයන්ගෙන් ඉටු විය යුතු වගකීම් 2ක් ලියන්න
19. ප්‍රාදේශීය අවශ්‍යතා දෙකක් ලියන්න
20. ප්‍රාදේශීය අවශ්‍යතා විවිධ වීමට බලපාන සාධක තුනක් ලියන්න

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| **ශ්‍රේණිය** | **විෂයය** | **වාරය** | **පාඩම** |
|---|---|---|---|
| 9 | **පුරවැසි අධ්‍යාපනය** | 2 | **4. පළාත් පාලන ආයතන - පිළිතුරු** |

**සැකසුම: සුනේත්‍රා විතානගේ**

**බප/හො/සිරිමෙවන් ම.වි, පොකුණුවිට**

1. ප්‍රජා සේවා පහසුවෙන් හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා නාගරික,අර්ධ නාගරික හා ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ආයතන විශේෂය
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රාදේශීය මට්ටම දක්වා පුළුල් කිරීම
   ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය වේගවත් කිරීම
3. බ්‍රිතාන්‍ය යුගයේදී
4. කොළඹ, ගාල්ල,මහනුවර
5. ගම් සභා, සුළු නගර සභා, නගර සභා , මහ නගර සභා
6. මහ නගර සභා , නගර සභා , ප්‍රාදේශීය සභා
7. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින්
8. 23
9. නගරාධිපති/පුරපති
10. සභාපති
11. නාගරික කොමසාරිස්
12. සභාව කැඳවීම හා කල් තැබීම, සභාවේ මුලසුන දැරීම
13. වරිපණම් බදු ඇතුළු අනෙකුත් බදු පැනවීමට, නිවාස සැලසුම් අනුමත කිරීමට
14. වරිපනම්/බදු මුදල්, පොදු සේවා සැපයීමෙන් ලැබෙන ආදායම්
15. ජන වාර්ගික ජනගහන අනුපාතය , භූගෝලීය ප්‍රදේශය හා එහි භෞතික ලක්ෂණ
16. පුස්තකාල , ප්‍රාදේශීය මාර්ග නඩත්තු කටයුතු , ප්‍රතිචක්‍රීකරණය සඳහා කසළ එක් රැස් කිරීම
17. කලට වේලාවට නියමිත බදු ගෙවීම, සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම
18. ප්‍රදේශයේ සම්පත් හඳුනා ගැනීම, මහජන අවශ්‍යතා කාර්යක්ෂමව ඉටු කිරීම
19. වියළි කලාපීය ප්‍රදේශවල ජනතාවට පානීය ජලය සැපයීම
    අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස පහසුකම් සැපයීම
20. සම්පත් වල ව්‍යාප්තිය, සංස්කෘතික විවිධත්වය , භූගෝලීය පසුබිම